# පුරප්පාඩු

## ජ්‍යෝෂ්ඨ කළමනාකරු (කර්මාන්තශාලා)

## (ස්ථිර /කොන්ත්‍රාත්)

**වසර 27 පුරා තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ඨයකු ලෙස නම් දරා සිටින සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ ජ්‍යෝෂ්ඨ කළමනාකරු (කර්මාන්තශාලා) තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබාතිබීම.

සහ

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ඇති තේ කර්මාන්තශාලාවක තේ නිෂ්පාදනය පිළිබඳ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද, ඉන් අවම වශයෙන් වසර 10 ක් වත් තේ නිෂ්පාදනය පිළිබඳ (සීටීසී/ ඕතඩොක්ස්) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

බාහිර සුදුසුකම් හෝ තේ කර්මාන්තශාලාවක තේ නිෂ්පාදනය පිළිබඳ වසර 15ක පළපුරුද්ද, ඉන් අවම වශයෙන් වසර 05 බැගින් සීටීසී හා ඕතඩොක්ස් තේ නිෂ්පාදනය පිළිබඳ පළපුරුද්දක් තිබීම සහ කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබාතිබීම.

**වයස**

අවු: 35ට නොඅඩු හා අවු: 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

**මාසික වැටුප් පරිමාණය**

කළමනාකරන සේවා 1/2025 චක්‍රලේඛනය අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.

HM 1 – 1- 2025 රු. 140,640/- 15 x 4,100/- 202,140/

වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව රු. 17,800.00 ක් හිමි වේ.

**අනෙකුත් වරප්‍රසාද**

- ජීවන වියදම් දීමනා
- නිල නිවසක් හෝ ඒ සඳහා දීමනාවන්
- නිල වාහනයක් හෝ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ප්‍රවාහන පහසුකම්
- කර්මාන්තශාලා කළමනාකරුවන්ට ලබා දෙනු ලබන කම්කරු පහසුකම්/ කම්කරු දීමනා
- ආකර්ශනීය වෛද්‍ය රක්ෂණාවරණයක් (පවුලේ සාමාජිකයින් ඇතුළුව)
- සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල්
- කාර්යය සාධනය මත දෙනු ලබන දීමනා
- වාර්ෂික ප්‍රසාද දීමනා
- දුරකථන දීමනාව
- තේ කොළ දීමනාව
- තනතුරට හිමි අනෙකුත් වරප්‍රසාද හා වෙනත් ප්‍රතිලාභ

ඔබගේ අයදුම්පත ජීව දත්ත සමඟ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කල හැකි සහතික, සහතික කරන ලද පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය

තවද, දැනටමත් රජයේ, සංස්ථා, මණ්ඩලවල සේවයේ යෙදීසිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලාකික පුරවැසියෙකු විය යුතු සහ මනා ශරීර සෞඛ්‍යකින් හා ධනාත්මක අදහස්වලින් පිරි ක්‍රියාශීලි අයෙකු විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ හැකියාව තිබිය යුතුය.

තෝරා ගැනීම සඳහා කිනම් අයුරකින් හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමට හේතු වනු ඇති අතර, අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අවසාන තීරණය වේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති ඔබගේ ආදර්ශ අකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය 2026.02.08 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර ලිවුම් කවරයේ වම් කෙළවර ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, නො. 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල**